කෙටි කතාව

# අභිනික්මන

ලක්ෂ්මන් වැලිවිටිය
Barrister & Solicitor

''පූර්ණිමා'' බැමිණිය යහන් ගැබෙන් එබෙන්නීය. නුගරුක් සෙවනේ වැඩහොත් තම පුත්, ''පරමාර්ථ' දුටුවාය. සඳපහනින් හා තරු එළියෙන් පරමාර්ථ ගේ උතුරු සළුව අඳුරේ බැබලුණි. නොමේරූ සුවඳක් ඔහුගේ වත පුරා විය. තියුණු භක්තියෙන්, මහඟු ප්‍රඥාවකින් සන්නද්ධ වූ පරමාර්ථගේ වුවනේ සොම්නසක හෝ දොම්නසක ඡායාවක් නොවීය. ඔහු නිසසළ සුවයක් විඳින්නේය. විවර වූවා දෝ, වැසුවාදෝ නොපෙනෙන නෙතු පියන් කාන්තිමත් විය. සඳරැස් වැදි තරු එළියේ ඔහුගේ ආරෝහ පරිනාහ දේහය බැබළෙන්නට වූයේය. හිරු රැස් වැදී එය යවටක් මෙන් රත්විය. අව් රශ්මියේ කටුක වියළි බව හෝ සඳ රශ්මියේ කටුක සිසිලස ගෙන හමා ආ සුළඟේ වෙනසක් පරමාර්ථ ට නොදැනිණි. ඔහුගේ මුදු තෙපුල්ද සුකොමළ වතෙහි ලාලිත්‍යයද සිහි වූ පූර්ණිමා ගේ හදවතෙහි පුතු ගැන වූ ආනන්දයක් නැගුණි. තම පුතු තුළ ශ්‍රේෂ්ඨ ප්‍රඥාවන්තයෙකු ඕ දුටුවාය. ශාන්ත වතින් හෙබි මුණිවරයෙකු ඕ දුටුවාය. ආලෝකමත් නෙතු පියන් වලින්ද, වක් නැහැයෙන්ද, එල්ලා හැලුණු පුළුල් කන් පෙති වලින්ද, දැඩි බාහු යුගලින් හා තද මස් පිඬු වලින්ද, සංකීර්ණ වූ පුර්ෂාර්ථයක් ඇයට දිස්විය. කෙළවර දී කදිම කඩවසම් තරුණයකු තම පුතු තුළින් පූර්ණිමා දුටුවාය. පුතු තුළින් පිටාර ගලන අධ්‍යාත්මික ප්‍රේමයද, උදාර මනෝ භාවයන්ද, ශ්‍රේෂ්ඨ පරමාර්ථයන්ද, මවගේ හද තුළ පිවිතුරු සුගන්ධියක් ඇති කළෝය. පුතුගේ සියලු පරමාර්ථයන් ගෙන් මව අබිසෙස් ලැබුවේ, ඕ විසින්ම පූජෝපහාරයට පත් විය. පූර්ණිමා ගේ සිත සොම්නසින් පිරී ඉතිරෙන්නට විය. ඇය යහන් ගැබේ කවුළුපියන් පත් අතරේ දෑත් ඔබා සිය පුතු වූ ''පරමාර්ථ'' දෙස නොසැලී බලා සිටියාය.

ඇයට කුටියේ හුදකලා බවත්, තෙළ බවුන් වඩනා තම පුත් පරමාර්ථ වටා දැවටෙන සුවඳත් දැනුණි. ශ්‍රේෂ්ඨ බලාපොරොත්තු මුසු වූ ප්‍රේමයක් ඇය තුළ විය. පුතු මවට සැබවින්ම සුවඳක් විය. ස්වකීය ගර්භිත ජීවිතයත්, ජීවිතය පුරා වූ නිස්සාර ඇවතුම් සහ පැවතුම් සාරවත් වූයේ තම පුතු නිසා යැයි ඇය සිතන්නීය. පුතු ශ්‍රේෂ්ඨයකු සේද, ප්‍රඥායකු සේද, ප්‍රවීණයකු සේද, මව නොයෙක්වර දුටුවාය. තවත් විටෙක තම පුතු තුළ වන මහා සන්සුන් බව තුළ ගලා හැලුණු පියවි පුරුෂාර්ථයන්ගේ යථාර්ථය දුටු ඕ සැලෙන්නට වූවාය.
පූර්ණිමාට තම යෞවනය සිහිපත් විය. එක්වරම පිපිරුණු අකුණු සැරයක් සේ ඇයගේ අභ්‍යන්තරය ඉරිතැලී සැලෙන්නට වූයේ, ඕ නැවතත් තම පුතු දෙසම බලා සිටියා ය. තමාගේ හදවත තුටුපහටු කරන ''තේජස්'' පරමාර්ථ නම් බ්‍රාහ්මණ පුත්‍රයා තුළින් නැගී පිටමන් වන ආරෝහ පරිණාහයෙන් යුත් යෞවනයකු පෙනුණාය. ඇය තිගැස්සෙමින්, ඇවිද යන නව යෞවනයා දෙස බැලීය. ඇය බියටත් දොම්නසටත් පත් වූවාය. එහෙත් 'පරමාර්ථ' නිසොල් මනේ නිසලව හිඳ සිටියේ ඔහුගේ අඩවන් නෙතු නොසැළෙමින් තිබුණේය. නැවතත් පරමාර්ථ නම් බ්‍රාහ්මණ පුත්‍රයා තුළින් නැගිට ඉවත්ව යන තම පුතු ගේ යෞවනය මවට පෙනුණාය. ඕ තිගැස්සෙමින් ''ඕං කාරය'' තොල් මතුළාය. ''ඕං කාරය'' පරිපූර්ණත්වයේ සංකේතය බව ඕ දන්නීය. මනස තුටුපහටු වනවා වෙනුවට අසහනකාරී සිතිවිලි පැන නැගුණි. ''අනේ දෙවියනි, ..... පාපකාරී සිතිවිලි වලින් මා මුදවා ලනු මැනවැයි ඕ අතෘප්තිමත්ව තොල් මතුළාය. ඇයට සමාධිගත පුතුගේ රුව දකිත්ම ඔහු තුළින් ඉවත්ව නැගී යෞවනත්වයෙන් පූර්ණ තම පුතු, පියමන් කරන අයුරු නැවතත් පෙනුණාය. තම පුතුගේ ප්‍රතාපවත් දේහයද, උදාර සිතිවිලි ද පිටුපා ඇවිද යන පුතු වෙතින්, අලුත් ප්‍රේමයක සුවඳද, මවට දැනෙන්නට වූවාය. ඕ තිගැස්සෙමින් නැවත නැවතත් තම පුතු දෙස නෙත් හැර බලන්නේ 'පරමාර්ථ' නුගරුක් මුල් සෙවනේ නිසළව වැදහොත් සැටි දුටුවාය.

තම පුතු තමා අතහැර යනු ඇතැයි පූර්ණිමා සිතන්නට වී බොහෝ කල්ය. දැන් දැන් ඒ අරභයා ඇය තුල දොම්නසක් හෝ සොම්නසක් නොවූවාය. එම නික්මයාම අනිවාර්ය බව ඇය සිතන්නී පුදුමයට පත්වූවාය. තම පුතු තමා හැර දා යැතැයි වූ හඬක් මුල දී පූර්ණිමාගේ හදවතේ



ගැඹුරු තැනකින් ඇයට ඇසුණාය. ඒ හඬ නොඇසෙන සේ කන් වසා සිටියාය. හඬෙහි දෝංකාරය පපු කුහරයේ ගට්ඨනය වී පැලී පුපුරා හැලුණි. ක්‍රමයෙන් ඕ ඒ හඬට හුරු වූවාය. පුතුගේ නිසළ වුවන ආලෝකමත් නෙතු පියන් පත් දුටු ඕ එම හඬේ දෝංකාරය නිරන්තරයෙන්ම විඳින්නීය. කල්යත්ම දෝංකාරය වූ හඬ නිශ්ශබ්ද වන්නේ දැන් දැන් පූර්ණිමා එම නිශ්ශබ්දතාවයට බලවත් සේ ප්‍රේම කළාය.

පරමාර්ථ ගේ දෙනෙත් සෙමෙන් විවර විය. තෙල පෙණෙනා මවගේ කුටිය වෙත දෙනෙත් යොමු වී තිබුණි. තමා දෙස නෙත් හලා සිටින මව ඡායාවක් සේ පෙනුණි. හේ අධ්‍යාත්මිකව නිද්‍රෝපගතව හුන් මිනිසෙකු සේ සෙමෙන් වෙවුලන්නට විය. වමතින් මිදුණු දකුණත හුරුව තිබූ යමක් සොයන්නා සේ වෙවුලවා ලූ ඔහු පැන් බඳුන ගෙන මුවට වත් කළේය. සුළඟින් විවර වූ උතුරු සලුවෙන් නග්න වූ ගෙල සිට උදරය තෙක් ජල බිඳු ගලා හැලෙන්නේ ය. නිසසල ජල කඳක සර්ප දණ්ඩෙකු පිනා යන විටෙක දී නැගෙන රැළි සේ උදරයේ රැළි නංවමින් ජල බිඳු පහලට ඇදෙනවා පූර්ණිමා සඳ එළියේ දුටුවාය.

''පරමාර්ථ'' ප්‍රකෘතියට නෙත් හැරියේය. හේ හුදකලා මවගේ රුබර දෑස් කවුළුවෙන් දුටුවේය. මවගේ දීප්තිමත් දෙනෙතෙහි සටහන් වූ හුදකලාව, පාලුව බියමුසු සැක සංකාවන් පරමාර්ථ දුටුවේ තුශ්නිම්භූත වීය.

තමා විඳි ප්‍රමෝදය ගැන වූ ප්‍රිතියත් හුදකලා වූ මව පිළිබඳ කම්පනයක්ද දැනෙන්නට විය. ඔහු තුළ ශෝකයක්ද, සියල්ල කෙරෙහි සැකයක්ද, මෝරන්නට වීය. පුලුල් අතෘප්තියක් නැගුණෝය.

මනස එක් අරමුණක් අරභයා මෙහෙයවීම, ආශ්චර්යයයක් වීද? ඒ මේ වැනෙනා සිතිවිලි දහරා ඔබමොබ ගන්නා විට, කේන්ද්‍රීය අරමුණක එක්තැන් වීම කෙතරම් දුෂ්කර වීද?

මොහොතකින් සන්සුන් වන සිතිවිලි එවිටම නොසන්සුන් වේ. අරමුණු අරභයා චංචල වන චේතනා නිසංසල වීම කෙතරම් අසීරුද? එය කෙතරම් දෘඪ ව්‍රතයක් ද?
නුග සෙවනේ වැද, සමාධිගතව ලත් නිරාමිස ප්‍රීතිය, පරමාර්ථ සිහි කළේය. සිහිනෙන් ආලේප කළ සුවඳක් සේ සිය ප්‍රීතිය තෘප්තිමත්ව වින්දේය. හේ ගැඹුරු මුහුදෙහි මත්ස්‍යයෙකු සේ කිමිදුණේය. වාතය කපා කුරුල්ලෙකු මෙන් නුබ ගැබ පියෑඹුවේය. උරගයෙකු මෙන් නැමී වක් වී බඩ ගෑවේය. වඳුරු පෝතකයෙකු සේ අත්තෙන් අත්තට පැන අතු අගිල් එල්ලා වැටුණේය. අහස් කුසට නැග පුලුල් වලා පෙළක නැගී පහලට ආයේය.

පරමාර්ථට දැඩි කුසගින්නක් දැනෙන්නට විය. සෙමින් දෙනෙත් විවර කළ ඔහු මුව තුළ වූ දියබිඳු දෙතොලින් තෙමන්නේ, තමා දෙස බලා සිනාසෙන මව දුටුවේය. ''මිනිසා ඊශ්වර සඳහා වූ පූජාවකි'' මවගේ ආලෝකමත් වූ වුවනින් ප්‍රකාශ විය. දෙවියන් සඳහා තමා පූජාවක් වී ඒ සඳහා පේ වී සිටින බවත්, එහෙත් ආත්මය චංචල බවත් එය ස්ථිර නොවන බවත්, ඔහුට දැනුණේය. තමා තුළ මතුවන කනස්සල්ල කුමක්ද? අතෘප්තිය කුමක්ද? ඊශ්වර සමග ඒකබද්ධ වීමේ ආනන්ද පිළිබඳ බියක්ද සත්‍ය තුළ සන්ත්‍රාසයක්ද, අස්ථිරතාවයක්ද, මෝරන්නට වූවේය. ආත්මන් සත්‍යයක්ද? චින්තනයම ආනන්දය ලැබිය හැකිද? සත්‍ය චින්තනයට ගෝචර වේද? සැක සංකා ඔහු තුළ මෝරන්න වීය. කාමයෙන් හා රාගයෙන් ද, තෘෂ්ණාවෙන් හා තෘප්තියෙන්ද, අලංකාරයන් ගෙන්ද, නිදහස්ව ආශාවෙන් දුරස්ථව ආත්මන් වෙත යන නිම නොවන ගමනේ හුදු කටුක බව මිස යථාර්ථයක් වේද? ලෞකික වින්දනය හැර දමා ලබන, ලෝකෝත්තර වින්දනය සැබෑ ආනන්දයක්ද? සැබවින්ම ආත්මන් වෙත කෙරෙනා වූ නමස්කාරය, ප්‍රේමය හා භක්තිය මුසු ඇල්ම රාගය නම් ක්ලේශ ධර්මය නොවන්නේද? පරමාර්ථගේ සිත ලෝලනය විය. ආත්මන් කෙරෙහි වන තෘෂ්ණාධික ඇල්ම, ප්‍රේමය හා භක්තිය සංසාරයේ බැඳ තැබීමක් වේද? පරමාර්ථගේ වත අඳුරු පැහැ ගත්තේය. තමා විඳි චිත්ත ප්‍රමෝදය කෙළවර වූ වහාම විමුක්තිය අරඹයා පවා උපන්නේ ආත්මාර්ථකාමී හැඟිම්ය. මව හුදකලා කොට ඇයගෙන් වියෝ වී විමුක්තිය ලැබිය යුතුද? මව අරබයා උපන් ප්‍රේමය තෘෂ්ණාවක් නොවේද? දෙවියන් අරභයා වන දැඩි ඇල්ම ඇල්මක් නොවන්නේද? ඇලීමෙන්, ගැලීමෙන්, විඳීමෙන් සංසාරයේ දුක පමණක් සමනය කළ හැකිද? සමස්ථයම ''මම'' තුළ මිස ''මම'' කෙරෙහි මිස, ''මම'' වෙනුවෙන් මිස වෙනත් යමක් නොවන බව පරමාර්ථට පසක් වන්නට වූයේය. මෙම අවබෝධයේ ආලෝකය පරමාර්ථ තුළ මහත් ආනන්දයක් ජනිත කළේය. 'මම'' යන්නෙහි වූ විශ්මිත බව ඔහුට හැඟුණේය.

තමා දෙස නොසැලී බලා සිටිනා මවගේ දයාබර මුදු බව ඔහුට දැනුණේ මහත් ස්නේහයෙන් හදවත පුරවාලමිනි. තැනින් තැන සැරිසරමින් සිටිද්දී බ්‍රාහ්මණයන් ඇය දූෂණය කරන්නට ඇත. ඇය අකමැති වන්නට ඇත. කැමති වන්නටද ඇත. කැමැත්ත හෝ අකමැත්ත නොවැදගත් වන්නටද ඇත. බ්‍රාහ්මණයන් විසින් ඇයට ඇයද, ඇයගේ පුතාගේ පියාද, අහිමි කරන ලදී.

''පරමාර්ථ''ට සිය නුදුටු පියා දැකීමේ අභිලාෂයක් මතු නොවූයේය. මව පිළිබඳ වූ දැඩි ස්නේහයක් තුරුලු වෙමින්, පියා කෙරෙහි වූ දැඩි කෝපයක් උපන්නේය. එය කෙමෙන් ලියලා වැඩෙමින් සමස්ථ බ්‍රාහ්මණ වර්ගයා කෙරෙහි වූ වෛරයක් බුරමින් ඔහුගේ හද තුළ නැංගේය. චේතනාවන් පවෙන් බර වීය. සියල්ල අපවිත්‍ර වීය. සන්සුන් වූ පරමාර්ථ සිය ජීවිතයේ පුද්ගලිකත්වය කෙරෙහි ඇලෙන ආකාරය ගැන සිතන්නට වූයේය. එක්වරම තමා කිසිදින විඳ නොවූ මෛථුනයද, ඒ සඳහා උපන් නොනවතින්නා වූ කුහුලක්ද නැංගේය. දෙවියන් සඳහා අභ්‍යන්තරයේ පූජා පැවැත්වීමෙන්, වාග් සංවරයෙන්,

උපවාසයෙන්, ආනාපාන යෙන්, ආනන්දයක් නොවන්නේ යැයි ''පරමාර්ථ''ට දැනුණේය. එක්වරම නුගරුක් සෙවනින් නැගුණු පරමාර්ථ සිය මව වෙත පියමන් කළේය. කවුළුවෙන් නුඹ මව එබී බලා සිටියාය. පුතු කවුළුවේ මෙපිට සිටන්, මව කවුළුවේ එපිට සිටන් බලා සිටියෙය. සියල්ල නිශ්ශබ්ද වීය. සඳ එළියේ සත්‍යකම වෙව්ලන්නාක් සේ ගැහෙන්නට වීය. ඒත් මව නොසැලී බලා සිටියාය. ඇය සියල්ලෙන් නිවුනා සේ වූවාය. මිදුණා සේ වුවාය. ඕ වෙවුලන තම පුතු අඳුරේ දකින්නී ඔහු කෙරේ කරුණාවක්, දයාවක් හෝ ප්‍රේමයක් නූපන්නීය. තමාගේ හදතුළ වූ හුරුපුරුදු නිශ්ශබ්දතාවය සෙමෙන් පිරිමදින්නී, ඇයට සියල්ල අවබෝධ වූවාය.

''මම නුඹ අතැර යමි....සැබෑ ජීවිතය සොයනු වස්....'' පරමාර්ථ වෙවුලමින් පැවසුවේය.
''මම එය දනිමි'' මව කීවාය.
''අවසර දෙන්න''
''අවසර දී බොහෝ කලක් ගතව ඇත...''
''මෑණියනි...''
''පුත, නුඹ පිටමන් වීමට මගෙන් අවසර ඉල්ලයි, නිශ්ඵලය. මගේ ආත්මය මගේ හදවත නුඹගෙන් පිටමන්ව බොහෝ කලක් ගතව ඇත. ''පුත'' සත්‍යයේ පිහිටන්න.''

පරමාර්ථ, ගල් ගැසුණේය. ඔහු වෙවුලමින්, නිශ්ශබ්දව, නොසැලී සිටි මව දෙස බැලුවේ, මොහොතින් තුශ්නිම්භූතව තම මව වෙත වැටී වැන්දේ ය. පූර්ණිමා ගේ දෙනෙතින් ගැලූ කඳුළු බිඳු පුතුට නොපෙනෙන සේ ඕ වමතින් පිස දැමුවාය.

■